## සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

1. **ශ්‍රේණිය** :-11 ශ්‍රේණිය **විෂය** :- : පෙරදිග සංගීතය **අදාළ සතිය :-** ඔක්තෝම්බර් 4 වන සතිය

**2.පාඩම/ ඒකකය**:-.5.2 මාපිය ගුණ වරුණ සඳහන් ගීත ගායනය කරයි.රස විඳියි.

**3. ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්:-**

- මාපිය ගුණ වරුණ සඳහන් ගීත 25ක් ගායකයා හෝ ගායිකාවගේ නම සහිතව පෙළ ගස්වන්න.
- ඉන් ගීත 5ක පද රචනා සොයා ගන්න.
- එම පද රචනා පිළිබඳ අධ්‍යනයක යෙදෙන්න.
- මාපිය ගුණ වරුණ ගී වලින් මතුවන අදහස පිළිබඳ පුවත් පතකට සුදුසු ලිපියක් ලියන්න.
- 11 ශ්‍රේණියට නිර්දේශිත මාපිය ගුණ වරුණ ගී 4ක් පිළිබඳ අධ්‍යයනය කරන්න.
- ඉන් එක් ගීතයක් තෝරා ගෙන හොඳින් ශ්‍රවණය කරන්න.
- ගීතයේ අර්ථය පිළිබඳ අවධානය යොමු කරමින් නැවත නැවත ශ්‍රවණය කරමින් ගීතය ගැයීමට පුරුදු වන්න.

**4.ඉහත ක්‍රියාකාරකම සඳහා උපකාර කර ගත හැකි ඉගෙනුම් ආධාරක**

- e - නැණ පියස:- 11 ශ්‍රේණිය
- 11 ශ්‍රේණිය අතිරේක කියවීම් පොත

  e- තක්සලාව -www.e.thaksalawa.mov.gov.lk
  https://www.youtube.com/watch?v=aLPoA_ysWHI
  https://www.youtube.com/watch?v=ANjITn3Mdm8

**5.අපේක්ෂිත ඉගෙනුම් ඵල:-**

- මාපිය ගුණ වරුණ ඇතුලත් ගීත සොයයි.
- එම ගීත වල පද මාලාවෙන් ප්‍රකාශිත අර්ථ පිළිබඳ අදහස් දක්වයි.
- ගී පද මාලා, තනුව, ගායනය සුසංගත වී ඇති අයුරු ලියයි.
- ගීතය නිවැරදිව ගායනා කරයි.

**6.ඇගයීම / තක්සේරුකරණ ක්‍රමවේදය හා ආකෘති :-**

- ව්‍යවහාරික සංගීත ක්ෂේත්‍රයේ රචනා වී ඇති මාපිය ගුණ වරුණ ගී ලයිස්තුවක් ගායකයා හෝ ගායිකාවගේ නම සහිතව ලියන්න.
- එක් ගීතයක් තෝරා ගෙන එහි පද මාලාවෙන් පිළිබිඹුවන අර්ථය ,තනුව, ගායකයාගේ කටහඬ, ගීතයට යොදාගෙන ඇති සංගීත භාණ්ඩ, රිද්මය යනාදි කරුණු මත ගීතය පිළිබඳ රසවින්දනාත්මක ලිපියක් සකස් කරන්න.
- තෝරා ගත් ගීතය හොඳින් ශ්‍රවණය කර තනිව ගායනා කරන්න.

**සැකසුම:-** කෑගල්ල අධ්‍යාපන කලාපය